1

**විශේෂ සටහන 1**

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන්වල වැදගත්කම

**පසුබිම**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) යනු ගෝලීය මූල්‍ය සහයෝගීතාව ධෛර්යමත් කිරීම, මූල්‍ය ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම, ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීම, ඉහළ රැකියා සහ තිරසාර ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සහ ලොව පුරා දරිද්‍රතාවය අවම කිරීම සඳහා 1944 වසරේ දී පිහිටුවන ලද සංවිධානයකි. ජා.මූ. අරමුදල සාමාන්‍යයෙන්, ජාත්‍යන්තර සංචිත නැවත ගොඩ නැංවීම, විනිමය අනුපාතිකය ස්ථාවර කිරීම, ආනයන වියදම් සඳහා ගෙවීම් අඛණ්ඩව සහතික කිරීම සහ ආර්ථික වර්ධනය ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළුව මූලික ගැටලු නිරාකරණය කිරීම අරමුණු කර ගනිමින් ගෙවුම් තුලන ගැටලු අත්විඳින සාමාජික රටවලට සහය වීම සඳහා සිය වැඩසටහන් යටතේ ණය ලබා දෙයි. ජා.මූ. අරමුදලේ සියලුම සාමාජිකයන්, ජා.මූ. අරමුදලේ සම්පත් සහනදායී නොවන කොන්දේසි මත සාමාන්‍ය සම්පත් ගිණුම (General Resources Account) යටතේ ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇති අතර, ජා.මූ. අරමුදල විසින් අඩු ආදායම්ලාභී රටවල විවිධත්වය සහ අවශ්‍යතාවලට ගැළපෙන ආකාරයෙන් සකස් කර ඇති දරිද්‍රතාවය අඩු කිරීම සහ වර්ධන භාරය (Poverty Reduction and Growth Trust) හරහා සහනදායී මූල්‍ය ආධාර ද සපයයි. අර්බුදවලට මුහුණදෙන නැගී එන වෙළඳපොළ සහ දියුණු වෙළඳපොල පවතින ආර්ථිකයන්ට, කෙටි කාලීන හෝ අනාගතයේදී සිදුවිය හැකි ගෙවුම් තුලන ගැටලු විසඳා ගැනීම සඳහා ජා.මූ. අරමුදලේ සහාය සමීපස්ථ ණය පහසුකම් (Stand-By Arrangements) හරහා සපයනු ලැබේ. අඩු ආදායම්ලාභී රටවල් සඳහා සමීපස්ථ වගකීම් පහසුකම (Stand-By Credit Facility) ඒ හා සමාන අරමුණක් සපුරනු ඇත. විස්තීර්ණ ණය පහසුකම (Extended Fund Facility) සහ අඩු ආදායම්ලාභී රටවල් සඳහා අනුරූපී වන විස්තීර්ණ වගකීම් පහසුකම (Extended Credit Facility) දිගු කාලීන ගෙවුම් තුලන ගැටලුවලට මුහුණ දෙන රටවලට මැදි කාලීන සහාය ලබා දීම අරමුණු කරගත් ප්‍රධාන පහසුකම් වේ. අර්බුද වැළැක්වීමට හෝ අවම කිරීමට සහ වෙළඳපොළ විශ්වාසය ඉහළ නැංවීමට, දැනටමත් ශක්තිමත් ප්‍රතිපත්ති පවත්වාගෙන යනු ලබන සාමාජිකයන්ට නම්‍යශීලී ණය පහසුකම (Flexible Credit Line) හෝ පූර්වාරක්ෂක සහ ද්‍රවශීලතා පහසුකම (Precautionary and Liquidity Line) භාවිතා කළ හැකිය. කඩිනම් මූල්‍යකරණ පහසුකම (Rapid Financing Instrument) සහ අඩු ආදායම්ලාභී රටවල් සඳහා අනුරූපී කඩිනම් ණය පහසුකම (Rapid Credit Facility) හරහා භාණ්ඩ මිල ඉහළ යෑමෙන් හටගන්නා කම්පන, ස්වභාවික විපත් සහ දේශීය ආර්ථිකයේ දුර්වලතා ඇතුළුව හදිසි ගෙවුම් තුලන අවශ්‍යතා ඇති රටවලට කඩිනමින් ආධාර සපයනු ලබයි. ජා.මූ. අරමුදල යටතේ ලබාදෙන අරමුදල් සැපයීමේ වැඩපිළිවෙලක අරමුණු, ප්‍රතිපත්ති සහ කොන්දේසි රඳා පවතින්නේ රටකට ආවේණික වූ ආර්ථික තත්ත්වයන් පදනම්ව ය.

වැඩසටහනක් සඳහා ජා.මූ. අරමුදල වෙත ප්‍රවේශ වීම සම්බන්ධයෙන් බොහෝ විට ඉස්මතු කරන කාරණය වන්නේ එයට සම්බන්ධ කර ඇති කොන්දේසීන්ය. සාමාන්‍යයෙන්, ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල කොන්දේසි, ප්‍රධාන සාර්ව ආර්ථික සහ ව්‍යුහාත්මක ප්‍රතිපත්ති ගැළපීම් ආවරණය කරයි. මෙම කොන්දේසි 1980 මුල් කාලපරිච්ඡේදය වන තෙක් ම සාර්ව ආර්ථික ප්‍රතිපත්ති කෙරෙහි වැඩි වශයෙන් යොමු වුව ද, අඩු ආදායම්ලාභී සහ සංක්‍රාන්ති රටවල් සමඟ ජා.මූ. අරමුදලේ සබඳතා වර්ධනය වීම පිළිබිඹු කරමින්, පසුකාලීනව එම ව්‍යුහාත්මක කොන්දේසිවල සංකීර්ණත්වය සහ විෂය පථය වර්ධනය විය. මෙම කොන්දේසි මගින් ගෙවුම් තුලනයේ ඇති ගැටලු විසඳා ගැනීමට මෙන්ම එවැනි ගැටලු නැවත නැවත ඇතිවීම වැළැක්වීම බලාපොරොත්තු වේ. තවද, නිවැරදි කිරීමේ පියවරයන් මගින් ආනයන සඳහා වන ගෙවීම් පියවීමට සහ තිරසාර ලෙස විදේශීය ණය ගෙවීමට හැකිවන මට්ටමට රටේ ගෙවුම් තුලනය ශක්තිමත් බව සහතික කිරීම අපේක්ෂා කෙරේ.

රටෙහි බලධාරීන්, ජා.මූ. අරමුදල සමඟ එකඟත්වය ඇතිකර ගන්නා වූ ප්‍රතිපත්තිමය බැඳීම්වලට සාමාන්‍යයෙන් ඇතුළත් වන්නේ:

**පූර්ව ක්‍රියාවන්:** පූර්ව ක්‍රියාවන් යනු රටක් ජා.මූ. අරමුදලෙහි වැඩසටහනක් යටතේ මූල්‍යකරණය අනුමත කිරීමට පෙර ක්‍රියාත්මක කිරීමට එකඟ වන පියවරයන් ය. වැඩසටහන් ඉලක්ක සාර්ථක ලෙස සපුරා ගැනීම සඳහා රටකට අවශ්‍ය පදනම ඇති බව සහතික කිරීම උදෙසා එවැනි ක්‍රියාවන් සැලසුම් කර ඇත. මිල පාලනයන් ඇත්නම් ඒවා ඉවත් කිරීම, මැදි කාලීන මූල්‍ය රාමුවට අනුකූලව රජයේ අයවැය සකස් කිරීම සහ ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීමට අදාළ පියවර ගැනීම සාමාන්‍යයෙන් පූර්ව ක්‍රියාවන්වලට ඇතුළත් විය හැකිය.

**ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක:** මෙම නිර්ණායක, මුදල් සහ ණය සමස්තයන්, ජාත්‍යන්තර සංචිත, රාජ්‍ය මූල්‍ය ශේෂයන් සහ විදේශීය ණය ගැනීම් වැනි බලධාරීන්ගේ පාලනය යටතේ පවතින සාර්ව ආර්ථික විචල්‍යයන්ට අදාළ නිශ්චිත, මැනිය හැකි කොන්දේසි වේ. සාමාන්‍යයෙන්

රජයේ ප්‍රාථමික ශේෂයේ අවම මට්ටමක්, රජයේ ණය ගැනීම් මත සීමාවක් සහ ජාත්‍යන්තර සංචිතවල අවම මට්ටමක් පවත්වාගෙන යෑම යනාදිය ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායකවලට ඇතුළත් විය හැකිය.

**දර්ශක ඉලක්ක:** වැඩසටහන් අරමුණු සපුරාලීමේ ප්‍රගතිය තක්සේරු කිරීමට ප්‍රමාණාත්මක දර්ශක සඳහා දර්ශක ඉලක්ක සැකසිය හැක. ආර්ථික ප්‍රවණතා පිළිබඳ අවිනිශ්චිතභාවය හේතුකොට ගෙන ඇතැම් විට ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක වෙනුවට දර්ශක ඉලක්ක දක්වා ඇත. එමෙන්ම, එවැනි අවිනිශ්චිතභාවයන් අඩු වන විට, මෙම ඉලක්ක සුදුසු ලෙස වෙනස් කිරීම් සහිතව ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක බවට නැවත පත් විය හැකිය. අවම වශයෙන් තිබිය යුතු රජයේ ප්‍රාථමික ශේෂය, දේශීය ආදායම් එකතු කිරීමේ මට්ටම සහ සමාජ සුභසාධන වියදම් ප්‍රමාණය, සාමාන්‍යයෙන් මෙම දර්ශක ඉලක්කවලට ඇතුළත් විය හැකිය.

**ව්‍යුහාත්මක මිණුම් දඬු:** මේවා බොහෝ විට ප්‍රමාණාත්මක නොවන නමුත් වැඩසටහන් ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතා වැදගත් වන ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග වේ. මූල්‍ය අංශයේ මෙහෙයුම් වැඩිදියුණු කිරීම්, සමාජ ආරක්ෂණ ජාල ගොඩ නැංවීම සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම සාමාන්‍යයෙන් ව්‍යුහාත්මක මිණුම් දඬුවලට ඇතුළත් විය හැකිය.

**කොන්දේසි සපුරාලීම අනුව ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල සාර්ථකත්වය**

ජා.මූ. අරමුදල එහි වැඩසටහන්වල කාර්ය සාධනය වරින් වර සමාලෝචනය කරනු ලැබේ. ජා.මූ. අරමුදලේ වැඩසටහන් නිර්මාණය කර ඇත්තේ ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සහ දර්ශක ඉලක්ක යනාදිය සපුරාලීම අනුව අරමුදල් මුදා හරින ආකාරයටයි. වැඩසටහනේ සාර්ථකත්වය වැඩි දියුණු කිරීමට සහ අවදානම් අවම කිරීමට, ජා.මූ. අරමුදල විසින් පුරෝකතනවල ප්‍රායෝගිකභාවය වැඩිදියුණු කිරීම, ණය තිරසාරභාවය විශ්ලේෂණය තීව්‍ර කිරීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ව්‍යුහාත්මක කොන්දේසි වඩා ගැළපෙන පරිදි වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කරයි. ජා.මූ. අරමුදල විසින් සපයනු ලබන කඩිනම් ණය පහසුකම (RCF) සහ කඩිනම් මූල්‍යකරණ පහසුකම් (RFI) සඳහා, සීමිත සමස්ත කොන්දේසි හැර, පසුවිපරම් වැඩසටහනක් පදනම් කරගත් කොන්දේසි හෝ සමාලෝචන නොමැත. යම් රටක් ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සපුරාලීමට අපොහොසත් වුවහොත්, එම අපගමනය සුළු/තාවකාලික හෝ රටෙහි බලධාරීන් විසින් නිවැරදි ක්‍රියාමාර්ග ගනිමින් සිටින්නේ නම් ද, වැඩසටහන එනමුත් සාර්ථක වන බවට සෑහීමකට පත්වන්නේ නම් ද, ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය එම අපගමනයන් සඳහා සහනයක් අනුමත කළ හැකිය. සාක්ෂාත් කරගැනීමට නොහැකි වූ ව්‍යුහාත්මක මිණුම් දඬු සහ දර්ශක ඉලක්ක සඳහා සහනයක් ලබාදීමට අවශ්‍ය නොවන නමුත් සමස්ත වශයෙන් වැඩසටහනේ ක්‍රියාකාරිත්වය තුළ එය තක්සේරු කරනු ලැබේ.

**ශ්‍රී ලංකාව සහ ජා.මූ. අරමුදල අතර අතීතයේ සිට පවතින සබඳතාව**

1950 වසරේ දී ජා.මූ. අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදලේ වැඩසටහන් දහසයකට සහභාගී වී ඇත. 1965 වසරේ දී ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදලේ පළමු වැඩසටහන හා සම්බන්ධ වූ අතර අවසන් වැඩසටහන 2016 වසරේ දී ආරම්භ විය. ජා.මූ. අරමුදලේ වඩාත්ම සාර්ථකම වැඩසටහන වූයේ 2009 වසරේ දී ආරම්භ කරන ලද සම්පස්ථ ණය පහසුකම වන අතර, මෙහිදී ජා.මූ. අරමුදල විසින් ශ්‍රී ලංකාවට සම්පූර්ණ අරමුදල් ප්‍රතිපාදන ලබා දී තිබේ. පෙර පැවති ජා.මූ. අරමුදලේ වැඩසටහන් මූලික වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ විදේශ සංචිත වැඩිදියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම කෙරෙහිය. ඊට අමතරව, ඉන්ධන මිල සූත්‍රයක් හඳුන්වා දීම, මහ බැංකුවේ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය සහ ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇතුළත් අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම කෙරෙහි ද අවධානය යොමු විය. ජා.මූ. අරමුදල සමග නිල ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, ජා.මූ. අරමුදලේ අධිපතිවරයා ලෙස ගරු මුදල් අමාත්‍යවරයා ද, ජා.මූ. අරමුදලේ විකල්ප අධිපතිවරයා ලෙස ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයාද කටයුතු කරයි.

මීට අමතරව, නම්‍යශීලී උද්ධමන ඉලක්ක රාමුව වෙත යොමු වීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම අරමුණු කරගත් පුරෝකථනය සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය ඇතුළුව ශ්‍රී ලංකා මහ බැංකුවට සහ රජයට බොහෝ තාක්ෂණික සහායන් ජා.මූ. අරමුදල විසින් ලබා දී ඇත.

**ශ්‍රී ලංකාව තුළ ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල සමස්ත සාර්ථකත්වය**

1965 වසරේ දී ආරම්භ කළ ජා.මූ. අරමුදලේ ප්‍රථම වැඩසටහනේ සිට බොහෝ වැඩසටහන්වලට සහභාගී වුව ද, බලධාරීන් විසින් ශ්‍රී ලංකාව තුළ සාර්ථකව ක්‍රියාත්මක කර ඇත්තේ වැඩසටහන් කිහිපයක් පමණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ මෙවැනි වැඩසටහන්වලට සම්බන්ධ, විශේෂයෙන් ම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවලට අවශ්‍ය වූ ආර්ථිකයේ දිගුකාලීන ඵලදායීතාවය වැඩිදියුණු

කිරීම් ඉලක්ක කරගත් දුෂ්කර සාර්ව ආර්ථික ගැළපීම් සහ ජනප්‍රිය නොවන ප්‍රතිපත්ති හා සම්බන්ධ වූ කොන්දේසි සපුරාලීමට අවශ්‍ය කැපවීමේ දුර්වලතාවයයි. විශේෂයෙන්ම, ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල ද බොහෝ විට ඇතුළත් වන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට ශ්‍රී ලංකාව රටක් ලෙස මුලපිරීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් ලෙස සිය ආර්ථික ප්‍රශ්න සඳහා විදේශයන්ගේ සහාය ලබා ගැනීමේ අවශ්‍යතාවය ඇති වී තිබේ. පෙර පැවති ජා.මූ. අරමුදලේ වැඩසටහන්වලින් හඳුනාගත් බොහෝ ප්‍රතිසංස්කරණ කෙටි කාලීන අරමුණු පමණක් සපුරාලමින්, මූල්‍ය පහසුකම් යටතේ යම් වාරික ලබා ගැනීමෙන් පසු සම්පූර්ණ කර නොමැතිව හෝ හදිසියේ නතරකර දමා ඇත. සංඛ්‍යා සටහන වි.ස. 1.1හි පෙන්වා ඇති පරිදි ජා.මූ. අරමුදලේ වැඩසටහන් සඳහා නිරන්තරයෙන් යොමු වීම් සහ ඉවත්ව යෑමේ චක්‍රීය ප්‍රවණතාවයක් මෙමගින් ඇති කර තිබේ. එසේ වුවත්, 1951 වසරේ සිට 1993 වසර දක්වා කාලය තුළ ජා.මූ. අරමුදලෙන් වැඩසටහන් හතක් ලබා ගත් ඉන්දියාව, 1993 වසරේ දී සිය අවසන් වැඩසටහන නිම කිරීමෙන් පසු ජා.මූ. අරමුදලෙහි වැඩසටහනක් වෙත යොමු වී නොමැත. ජා.මූ. අරමුදලේ වැඩසටහනක් සාර්ථකව නිම කළේ නම්, විශේෂයෙන්ම ව්‍යුහාත්මක ගැළපීම් හරහා ආර්ථිකයට දිගුකාලීන ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිව තිබූ අතර, කෙටිකාලීන ආර්ථික ගැටලු හේතුවෙන් අනාගත අවස්ථාවන්හි දී ජා.මූ. අරමුදල වෙත ප්‍රවේශ වීමේ අවශ්‍යතාවය ද අවම වන්නට තිබුණි. මෑතක දී, එනම්, 2009 සහ 2016 වසරවල දී ශ්‍රී ලංකාව වෙත ලබා දුන් ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල කොන්දේසි සපුරාලීමේ සාර්ථකත්වයෙහි සාරාංශයක් පහත දක්වා ඇත.

***2009 වසරේ ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම් වැඩසටහන***

සමීපස්ථ ණය පහසුකම යටතේ අටවන සහ අවසාන සමාලෝචනයට අදාළ ජා.මූ. අරමුදලේ නිලධාරීන්ගේ වාර්තාවට අනුව, ශ්‍රී ලංකාව වැඩසටහනට අදාළ ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්ක, ශුද්ධ දේශීය මූල්‍යකරණය සහ සංචිත මුදල් දර්ශක ඉලක්ක සපුරා ඇත. වැඩසටහන අවසන් වීමට පෙර පෞද්ගලික විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා වන නියාමන රාමුව සඳහා වූ යෝජිත ප්‍රතිසංස්කරණ හැර අනෙකුත් සියලු ම ව්‍යුහාත්මක මිණුම් දඬු ද ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කළේය.

***2016 වසරේ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන***

විස්තීර්ණ ණය පහසුකම යටතේ හයවන සමාලෝචනයට අදාළ ජා.මූ. අරමුදලේ නිලධාරීන්ගේ වාර්තාවට අනුව, 2019 වසරේ අප්‍රේල් මාසයේ පාස්කු ඉරු දින ප්‍රහාරයන්ගෙන් පසුව රාජ්‍ය ආදායම් සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන්, ශ්‍රී ලංකාවට රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්ක සපුරමින් සංචිත යළි ගොඩ නැංවීමට ද, විනිමය අනුපාතිකයෙහි ඉහළ නම්‍යශීලිභාවයක් සැලසීමට ද ශ්‍රී ලංකා මහ බැංකුව කැපවී සිටියේය. නම්‍යශීලී උද්ධමන ඉලක්ක සහ නම්‍යශීලී විනිමය

**සංඛ්‍යා සටහන වි.ස. 1.1**

**ශ්‍රී ලංකාව විසින් ලබාගත් ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල ඉතිහාසය**

000′ විශේෂ ගැනුම් හිමිකම්

| පහසුකම | ආරම්භ කළ දිනය | කල්පිරෙන දිනය | එකඟ වූ මුදල | ලබාගත් මුදල | නොපියවා ඉතිරිව ඇති මුදල |
|---|---|---|---|---|---|
| EFF | 2016 ජූනි 03 | 2020 ජූනි 02 | 1,070,780 | 952,230 | 892,283 |
| SBA | 2009 ජූලි 24 | 2012 ජූලි 23 | 1,653,600 | 1,653,600 | 0 |
| ECF | 2003 අප්‍රේල් 18 | 2006 අප්‍රේ. 17 | 269,000 | 38,390 | 0 |
| EFF | 2003 අප්‍රේල් 18 | 2006 අප්‍රේ. 17 | 144,400 | 20,670 | 0 |
| SBA | 2001 අප්‍රේල් 20 | 2002 සැප්. 19 | 200,000 | 200,000 | 0 |
| ECF | 1991 සැප් 13 | 1995 ජූලි 31 | 336,000 | 280,000 | 0 |
| SAFC | 1988 මාර්තු 09 | 1991 මාර්. 08 | 156,170 | 156,170 | 0 |
| SBA | 1983 සැප්. 14 | 1984 ජූලි 31 | 100,000 | 50,000 | 0 |
| EFF | 1979 ජන. 01 | 1981 දෙසැ. 31 | 260,300 | 260,300 | 0 |
| SBA | 1977 දෙසැ. 02 | 1978 දෙසැ. 01 | 93,000 | 93,000 | 0 |
| SBA | 1974 අප්‍රේ. 30 | 1975 අප්‍රේ. 29 | 24,500 | 7,000 | 0 |
| SBA | 1971 මාර්. 18 | 1972 මාර්. 17 | 24,500 | 24,500 | 0 |
| SBA | 1969 අගෝ. 12 | 1970 අගෝ. 11 | 19,500 | 19,500 | 0 |
| SBA | 1968 මැයි 06 | 1969 මැයි 05 | 19,500 | 19,500 | 0 |
| SBA | 1966 ජූනි 15 | 1967 ජූනි 14 | 25,000 | 25,000 | 0 |
| SBA | 1965 ජූනි 15 | 1966 ජූනි 14 | 30,000 | 22,500 | 0 |

මූලයඃ ශ්‍රී ලංකාවට අදාල පිටුව (ජා.මූ. අරමුදලේ වෙබ් අඩවිය)

EFF – විස්තීර්ණ ණය පහසුකම, SBA – සමීපස්ථ ණය පහසුකම, ECF – විස්තීර්ණ වගකීම් පහසුකම, SAFC – ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් කැපවීම

අනුපාතික ක්‍රමය සඳහා පෙර දැක්මක් සකස් කිරීම, බදු වියදම් ප්‍රකාශයක්, 2018 වසරේදී බදු අයකර ගැනීමට අදාළ වියදම් තාර්කීකරණය කිරීමට සැලැස්මක් සහ රජයේ වාණිජ ව්‍යවසායයන් සඳහා වන වාණිජ නොවන වගකීම්වල (සහනාධාර ඇතුළුව) ඇස්තමේන්තුගත මූල්‍ය පිරිවැය ඇතුළුව වැඩසටහන් ඉලක්කවලට අනුකූලව 2018 අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඵලදායී උපාය මාර්ගික සැලැස්මක් සහ මෙහෙයුම් ව්‍යාපාර ආකෘතියක් සකස් කිරීම, ආදායම් හිඟය පියවා ගැනීම සඳහා නව ආදායම් මූලාශ්‍ර සමඟින් මැදි කාලීනව තීරු බදු නොවන බදු වර්ග තාර්කික කිරීමේ උපාය මාර්ගයක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සහ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය එළිදැක්වීම ඇතුළුව අනෙකුත් ප්‍රධාන ව්‍යුහාත්මක මිණුම් දඬු ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකාව වැඩසටහන් යටතේ ඇති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සැලසුම්වල සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේය.

**කලාපීය රටවල් නිරත වූ ජා.මූ. අරමුදල සමඟ වැඩසටහන්**

කලාපයේ අනෙකුත් රටවල් ද තම ආර්ථික තත්ත්වයන් මත වරින් වර ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල නිරත වී

**සංඛ්‍යා සටහන වි.ස. 1.2**

**තෝරාගත් කලාපීය රටවල් විසින් ජා.මූ. අරමුදලෙන් ලබාගත් නවතම වැඩසටහන්**

000' විශේෂ ගැනුම් හිමිකම්

| පහසුකම | ආරම්භ කළ දිනය | කල්පිරෙන දිනය | එකඟ වූ මුදල | ලබාගත් මුදල | නොපියවා ඉතිරිව ඇති මුදල |
|---|---|---|---|---|---|
| පකිස්ථානය | | | | | |
| EFF | 2019 ජූලි 03 | 2022 ඔක්. 02 | 4,268,000 | 2,144,000 | 2,144,000 |
| RFI | 2020 අප්‍රේ. 16 | 2020 අප්‍රේ. 20 | 1,015,500 | 1,015,500 | 1,015,500 |
| EFF | 2013 සැප්. 04 | 2016 සැප්. 30 | 4,393,000 | 4,393,000 | 2,244,750 |
| SBA | 2008 නොවැ. 24 | 2011 සැප්. 30 | 7,235,900 | 4,936,035 | 0 |
| ECF | 2001 දෙසැ. 06 | 2004 දෙසැ. 05 | 1,033,700 | 861,420 | 0 |
| ඉන්දියාව | | | | | |
| SBA | 1991 ඔක්. 31 | 1993 ජූනි 30 | 1,656,000 | 1,656,000 | 0 |
| SBA | 1991 ජන. 18 | 1991 අප්‍රේ. 17 | 551,925 | 551,925 | 0 |
| EFF | 1981 නොවැ. 09 | 1984 මැයි 01 | 5,000,000 | 3,900,000 | 0 |
| SBA | 1965 මාර්. 22 | 1966 මාර්. 21 | 200,000 | 200,000 | 0 |
| SBA | 1963 ජූලි 09 | 1964 ජූලි 08 | 100,000 | 0 | 0 |
| බංගලාදේශය | | | | | |
| RCF | 2020 මැයි 29 | 2020 ජූනි 02 | 177,770 | 177,770 | 177,770 |
| RFI | 2020 මැයි 29 | 2020 ජූනි 02 | 355,530 | 355,530 | 355,530 |
| ECF | 2012 අප්‍රේ. 11 | 2015 ඔක්. 29 | 639,960 | 639,960 | 283,411 |
| ECF | 2003 ජූනි 20 | 2007 ජූනි 19 | 400,330 | 316,730 | 0 |
| ECF | 1990 අගෝ. 10 | 1993 සැප්. 13 | 345,000 | 330,000 | 0 |
| නේපාලය | | | | | |
| ECF | 2022 ජන. 12 | 2025 මාර්. 11 | 282,420 | 78,500 | 78,500 |
| RCF | 2020 මැයි 06 | 2020 මැයි 08 | 156,900 | 156,900 | 156,900 |
| RCF | 2015 ජූලි 31 | 2015 අගෝ. 10 | 35,650 | 35,650 | 24,955 |
| ECF | 2003 නොවැ. 19 | 2007 නොවැ. 18 | 49,900 | 49,900 | 0 |
| ECF | 1992 ඔක්. 05 | 1995 ඔක්. 04 | 33,570 | 16,785 | 0 |
| මාලදිවයින | | | | | |
| RCF | 2020 අප්‍රේ. 22 | 2020 අප්‍රේ. 24 | 21,200 | 21,200 | 21,200 |
| SBA | 2009 දෙසැ. 04 | 2012 දෙසැ. 03 | 49,200 | 8,200 | 0 |
| ESF | 2009 දෙසැ. 04 | 2011 දෙසැ. 03 | 8,200 | 2,050 | 0 |
| ඇෆ්ගනිස්ථානය | | | | | |
| ECF | 2020 නොවැ. 06 | 2024 මැයි 05 | 259,040 | 184,566 | 184,566 |
| RCF | 2020 අප්‍රේ. 29 | 2020 ජූනි 23 | 161,900 | 161,900 | 161,900 |
| ECF | 2016 ජූලි 20 | 2019 දෙසැ. 31 | 32,380 | 32,380 | 31,930 |
| ECF | 2011 නොවැ. 14 | 2014 නොවැ. 13 | 85,000 | 24,000 | 1,200 |
| ECF | 2006 ජූනි 26 | 2010 සැප්. 25 | 81,000 | 75,350 | 0 |

මූලයන්: පකිස්ථානය, ඉන්දියාව, බංගලාදේශය, නේපාලය, මාලදිවයින සහ ඇෆ්ගනිස්ථානය යන රටවල්වලට අදාළ පිටු (ජා.මූ. අරමුදලේ වෙබ් අඩවිය)

EFF – විස්තීර්ණ ණය පහසුකම, RFI – කඩිනම් මූල්‍යකරණ පහසුකම, SBA – සම්පස්ථ ණය පහසුකම, ECF – විස්තීර්ණ වගකීම් පහසුකම, RCF – කඩිනම් ණය පහසුකම, ESF – බාහිර කම්පන පහසුකම

1

ඇත. කොවිඩ්-19 වසංගතය හමුවේ වූ ආර්ථික බිඳවැටීම් සමඟ ජා.මූ. අරමුදලේ වැඩසටහනක් අපේක්ෂා කරන රටවල් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි විය. කලාපීය රටවල් විසින් මෑතක දී ලබාගත් ජා.මූ. අරමුදලේ වැඩසටහන් ලැයිස්තුවක් සංඛ්‍යා සටහන වි.ස. 1.2හි දක්වා ඇත.

**ජා.මූ. අරමුදල සමඟ අනාගත වැඩසටහනකින් ශ්‍රී ලංකාවට ඇති බලපෑම්**

කලින් සඳහන් කළ පරිදි, ගෙවුම් තුලනයෙහි තත්ත්වය සහ රජයේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට අධාර වීම සඳහා ශ්‍රී ලංකාව වරින් වර ජා.මූ. අරමුදලේ වැඩසටහන්වලට ඇතුළත් වී ඇත. කෙසේ වෙතත්, පෙර අවස්ථා මෙන් නොව, වත්මන් තත්ත්වය සලකා බැලීමේ දී, ජා.මූ. අරමුදලේ වැඩසටහනක් වෙත යොමු වීම රටෙහි පවතින අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් ජය ගැනීම වෙනුවෙන් වූ උපාය මාර්ගවල වැදගත් කොටසක් වනු ඇත. වර්තමානයේ පවතින පහළ විදේශ සංචිත මට්ටම සලකා බැලීමේ දී, කෙටි කාලීනව ගෙවීමට ඇති සැලකිය යුතු ඉහළ ණය සේවාකරණය කිරීම අතිශයින් අභියෝගාත්මක වනු ඇත. ඉහළ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ විදේශ විනිමය ලැබීම් අඩු වීම මධ්‍යයේ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව පහළ ගොස් ඇති අතර, ඒ හේතුවෙන් දළ නිල සංචිත සැලකිය යුතු ලෙස පහළ ගිය අතර ඉන්ධන, ගෑස්, ගල් අඟුරු, ඖෂධ, සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වැනි අත්‍යවශ්‍ය ආනයන සඳහා විදේශ විනිමය ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් විදේශ විනිමය නොමැති විය. මෙම ප්‍රවණතා හමුවේ, නුදුරු අනාගතයේ දී සැලකිය යුතු විදේශීය මූල්‍යකරණ ප්‍රමාණයක් සුරක්ෂිත කර ගැනීමේ අවශ්‍යතාවයක් පවතී. ජා.මූ. අරමුදලේ වැඩසටහනකට ඇතුළත් වීම තුළින් අමතර මූල්‍යකරණය සඳහා ප්‍රවේශය ලබා දීම පමණක් නොව බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික මූලාශ්‍ර ඇතුළු විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය ද වර්ධනය කරයි. මෙය ඇතුළු සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක කිරීම තුළින් සමස්ත සාර්ව ආර්ථිකය ස්ථාවර කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් ණය නොවන මූල්‍ය ලැබීම් තවදුරටත් ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

අනාගතයේ ජා.මූ. අරමුදලේ වැඩසටහනක් පිළිබඳ සාකච්ඡාවකදී සලකා බැලිය හැකි ප්‍රධාන ක්ෂේත්‍ර අතරට රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, සුදුසු මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, විනිමය අනුපාතිකයෙහි නම්‍යශීලීභාවය, මහ බැංකුව රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා මූල්‍යනය ක්‍රමානුකූලව අඩු කිරීම, රජය සතු වාණිජ ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම, ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රමයෙන් ඉවත් කිරීම, උපයෝගිතා සඳහා වෙළෙඳපොළ පදනම් වූ මිල සූත්‍ර හඳුන්වා දීම සහ සමාජ ආරක්ෂණ ජාල ශක්තිමත් කිරීම මෙන්ම තවත් ක්ෂේත්‍ර ඇතුළත් විය හැකිය. ඉහත සඳහන් ක්‍රියාමාර්ගයන් සමහරක් මහ බැංකුව සහ රජය විසින් දැනටමත් සිදු කර ඇත. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස දැඩි කිරීම, විනිමය අනුපාතිකය වැඩි වශයෙන් වෙළඳපොළ බලවේග විසින් තීරණය කිරීම, ඛනිජ තෙල් සහ එල් පී ගෑස්වල දේශීය මිල පිරිවැය පිළිබිඹු වන ලෙස ගැළපීම යනාදිය සිදු කර ඇත. මෙම සාර්ව ආර්ථික ස්ථායීකරණ පියවරයන් ගැළපුම් අවධියේ දී ආර්ථිකයට අසීරු වෙනස්කම් සිදු කළ හැකි නමුත් වත්මන් ආර්ථික අර්බුදය සලකා බැලීමේ දී ඒවා අත්‍යවශ්‍ය වී ඇත. කෙසේ වෙතත්, ජා.මූ. අරමුදලේ වැඩසටහනක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා, සුදුසු ක්‍රියාමාර්ග හරහා තිරසාර ලෙස විදේශීය ණය කළමණාකරණය කිරීම රට විසින් සහතික කළ යුතුය. මේ සඳහා, ජා.මූ. අරමුදලේ සහය දක්වන ආර්ථික ගැළපුම් වැඩසටහනකට අනුකූල වන පරිදි, ණය වගකීම් ක්‍රමානුකූලව සහ එකඟතාවයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා, විදේශීය ණය සේවාකරණය කිරීම තාවකාලිකව අත්හිටුවන බව රජය දැනටමත් නිවේදනය කර ඇත. තවද, ජා.මූ. අරමුදලේ වැඩසටහනක් සාර්ථක ලෙස සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සියලුම පාර්ශ්වකරුවන් අතර එකඟතාවක් හරහා දේශපාලන හා සමාජ ස්ථාවරත්වයක් ළඟා කර ගත යුතුය. එහි සාර්ථකත්වය රඳා පවතිනු ඇත්තේ දිගු කලක් තිස්සේ නොසලකා හරින ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ තිරසාර සාර්ව ආර්ථික ස්ථායීතාවයක් සහතික කරන ආකාරයෙන් ක්‍රියාත්මක කරන ප්‍රමාණය මත ය.

---

මූලාශ්‍ර

1. International Monetary Fund. (2022). Sri Lanka: 2021 Article IV Consultation - Press Release, Staff Report, and Statement by the Executive Director for Sri Lanka. 091. International Monetary Fund, Washington D.C.
2. International Monetary Fund. (2019). Sri Lanka: Sixth Review Under the Extended Arrangement Under the Extended Fund Facility and Requests for Waiver of Nonobservance and Modification of Performance Criterion - Press Release, Staff Report, and Statement by the Executive Director for Sri Lanka. 335. International Monetary Fund, Washington D.C.
3. International Monetary Fund. (2012). Sri Lanka: Eighth and Final Review Under the Stand-By Arrangement - Staff Report, Press Release on the Executive Board Discussion; and Statement by the Executive Director for Sri Lanka, Staff Report, and Statement by the Executive Director for Sri Lanka. 198. IMF.
4. Factsheet - International Monetary Fund Conditionality [Online]. Available at: https://www.imf.org/en About /Factsheets Sheets/2016/08/02/21/28/IMF-Conditionality#:~:text=When%2 a%20 country%20borrows%2 from,able%20to%20repay%20the%20IMF
5. International Monetary Fund's Sri Lanka Country Page [Online]. Available at: https://www.imf.org/en/Countries/LKA